මාධ්‍ය නිවේදනය

<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල් වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවාගැනීම</u>

උක්ත බඳවාගැනීමට අදාළව කැඳවීම් ලිපිය සමඟ යොමු කළ නිවේදනය අනුව පාසල් සඳහා මානාපය පළ කිරීම සඳහා තොරතුරු ඇතුලත් කිරීමේ මාගර්ගත පද්ධතිය මේ වන විට සකස්කරමින් පවතින අතර 2026.11.17 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ප්‍රදශර්නය කරනු ලබන Teacher recruitment Application system වෙත පිවිස පුරප්පාඩු පාසල් වෙත මනාපයන් පළ කල හැකි ය. එහිදී, ඔබ වෙත යොමුකර ඇති ලිපියෙහි මුරපදය (OTP) සමඟ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විභාග අංකය ඇතුළත් කර මෙම පද්ධතියට පිවිසීම සිදුකළ යුතු ය. මේ දක්වා ඔබ වෙත තැපල් මගින් යොමු කරන ලද ලිපිය ලැබී නොමැති නම්, එම ලිපිය ලැබෙන තෙක් මෙම පද්ධතියට පිවිසීමට හැකියාවක් නොමැත.

ලිපි ලැබීමේ ප්‍රමාදයක් පිළිබඳව ඇතැම් අයදුම්කරුවන් දක්වා ඇති බැවින්, යම් අයදුම්කරුවෙකුට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය මේ දක්වා ලැබී නොමැති නම් ඒ පිළිබඳව කලබල නොවන ලෙසත්, පද්ධතියට ඇතුළත් වීමට නොහැකි වන අයදුම්කරුවන් සඳහා අදාළ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති දින දක්වා එම පද්ධතියට පිවිසීමට තවදුරටත් අවස්ථාව සලසන බවත් කාරුණිකව දන්වමි. තවද, එදින වනවිට ලිපි නොලද අයදුම්කරුවන් වෙත පාසල් සඳහා මනාපය පළ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ දිනයේ දී අදාළ පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඒ.ජේ. එස්.එස්. එදිරිසූරිය
අතිරේක ලේකම් (ආයතන)
අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය